# පරීක්ෂක වාර්තාව

AA2 විභාගය - ජූලි 2017

## (AA22) පිරිවැය ගිණුම්කරණය හා වාර්තාකරණය

(Cost Accounting and Reporting)

---

මුළුමනින් ප්‍රශ්න 10 ක් සහිත කොටස් 4 කින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත විය. එමගින් පිරිවැය ගිණුම්කරණයට අදාල මූලික සංකල්ප පිළිබඳ දැනුම පරීක්ෂා කර තිබේ. අයදුම්කරුවන් සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයිය යුතු විය. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රය සමග අමුණා තිබුණි. ප්‍රශ්න 10 සකසා තිබුණේ පහත සඳහන් පරිදිය:

**A – කොටස -** ලකුණු 20

එකකට ලකුණු 1 ක් හෝ 2 ක් බැගින් වූ එකිනෙකට වෙනස් ස්වරූපයෙන් යුතු වාස්තවික පරීක්ෂණ ප්‍රශ්නවලින් සමන්විත විය. සියලුම ප්‍රශ්න වලට උත්තර ලිවිය යුතු විය.

**B – කොටස -** ලකුණු 25

එකකට ලකුණු 5 ක් බැගින් වූ අනිවාර්ය ප්‍රශ්න පහකි.

**C – කොටස -** ලකුණු 30

එකකට ලකුණු 10 බැගින් වූ අනිවාර්ය ප්‍රශ්න තුනකි.

**D – කොටස -** ලකුණු 25

කොටස් දෙකකින් යුතු එක් අනිවාර්ය ප්‍රශ්නයකි. (A) කොටසට ලකුණු 15 කුත්, (B) කොටසට ලකුණු 10 ක් සහිත එක් අනිවාර්ය ප්‍රශ්නයක් වශයෙනි.

එක් එක් ප්‍රශ්නය සඳහා වෙන්කරන ලද ලකුණු ප්‍රමාණය මගින් එම එක් එක් ප්‍රශ්නයට අදාලව වැයකළ හැකි කාලය පිළිබඳ මග පෙන්වීමක් ලබා දේ.

සමස්ථයක් වශයෙන් විභාගයේදී අයදුම්කරුවන් විසින් දක්වන ලද කාර්යසාධනය සතුටුවිය හැකි මට්ටමක නොතිබුණි. සමහර ප්‍රශ්න සඳහා උත්තර සැපයීමට අයදුම්කරුවන් උත්සහා දරා නොතිබූ අතර, එමනිසා සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය ලබා ගැනීමට දුෂ්කර විය.

| | | |
|---|---|---|
| **A කොටස** | : | සමස්ත කාර්යසාධනය සතුටුදායකය. |
| **B කොටස** | : | 05 සහ 06 ප්‍රශ්න හැර අනෙකුත් ප්‍රශ්න සඳහා කාර්යසාධනය සතුටුදායකය. |
| **C කොටස** | : | ප්‍රශ්න අංක 09 හැර සෙසු ප්‍රශ්න සඳහා වූ කාර්යසාධනය දුර්වලය. |
| **D කොටස** | : | සමස්ත කාර්යසාධනය දුර්වලය. |

## A - කොටස

(වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න)

(ලකුණු 20)

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නය ප්‍රධාන වශයෙන් යොමුවී තිබුණේ පිරිවැය ගිණුම්කරණයට අදාල මූලික සංකල්ප හා පිරිවැය ගිණුම්කරණයට හා වාර්තාකරණයට අදාල මූලික ගණනය කිරීම් පිළිබඳවය. සාමාන්‍යයෙන් සියලුම අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට උත්තර සපයා තිබුණු අතර ලබාගත් ලකුණු ප්‍රමාණයද සතුටුදායක මට්ටමක විය. 1.1, 1.2, 1.5, 1.6 (1) හා 1.8 (2) යන ප්‍රශ්නවලට බහුතරයක් අයදුම්කරුවන් විසින් නිවැරදිව උත්තර සපයා නොතිබුණි.

ඉහත දැක්වූ ප්‍රශ්න සඳහා සතුටුදායක ලෙස උත්තර සැපයීමට නොහැකිවීමට පාදක වූ හේතු වූයේ:

- අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය නිසියාකාරව කියවා නොතිබූ අතර, සපයා තිබූ උත්තර අනුව පිරිවැය ගිණුම්කරණය හා වාර්තාකරණයට අදාලව අයදුම්කරුවන් තුළ වූ අවබෝධය ඉතා අඩු බව තහවුරු විය. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQ) සඳහා කාර්යසාධනය ඉහළ නංවා ගැනීමට නම් අයදුම්කරුවන් පසුගිය ප්‍රශ්නපත්‍රවල වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න සඳහා උත්තර සපයා පුහුණු විය යුතු අතර තෝරා ගැනීමට ලබා දී ඇති උත්තර පිරිවැය ගිණුම්කරණයට අදාල මූලිකාංග පිළිබඳ වන අවබෝධයකින් යුක්තව සංසන්දනය කළ යුතු වේ.

- සමහර අයදුම්කරුවන්ට වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න සඳහා උත්තර සපයන ආකාරය පිළිබඳව දැනුමක් නොතිබුණු අතර උත්තර සමඟ සම්පූර්ණ ප්‍රශ්නයද නැවත ලියා තිබුණි. ඔවුන් අනවශ්‍ය ආකාරයට මේ සඳහා කාලය වැයකර තිබුණි. අයදුම්කරුවන් විසින් ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය පිළිබඳව අවබෝධ කරගත යුතුවේ.

## B කොටස

(එකකට ලකුණු 5 බැගින් අනිවාර්ය ප්‍රශ්න 5 කි)

(මුළු ලකුණු 25)

### ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නය ද්‍රව්‍ය පාලනයට අදාලව යොමුවී තිබුණි.

**(a) කොටස**

ආර්ථික ඇණවුම් ප්‍රමාණය [Economic Order Quantity (EOQ)] ගණනය කළ යුතුව තිබුණු අතර ගණනය කිරීමට අදාල සමීකරණයද ප්‍රශ්නය සමග සපයා තිබුණි. නමුත් ගණනය කිරීම් සමීකරණයට අදාල කරවීමට සමහර අයදුම්කරුවන්ට අවබෝධයක් නොතිබූ අතර, ගණනය කිරීම් ගණනය කිරීමේ දෝෂ වලින් යුක්ත විය. උදා:- සූත්‍රයේ වර්ගමූලය ගණනය කිරීම. සමහර අයදුම්කරුවන් එක් ඒකකයක ගැනුම් මිල සැලකිල්ලට ගැනීම නිසා, ලබාදෙන ලද උත්තර නිවැරදි නොවීය. නිවැරදිව අදාල දත්ත ආදේශ කිරීම සහ මූලධර්ම පිළිබඳ අවබෝධය ඉතා වැදගත් වේ. දී ඇති දත්ත අතුරින් ගණනය කිරීමට අවශ්‍යවන දත්ත පමණක් තෝරා ගැනීමට අයදුම්කරුවන් සුපරීක්ෂාකාරී විය යුතුය.

**(b) කොටස**

ද්‍රව්‍ය පාලනයේ අරමුණු පිළිබඳ වූ න්‍යායාත්මක දැනුම පරීක්ෂාවට ලක්කර තිබුණි. මෙය සරල හා නිශ්චිත ප්‍රශ්නයකි. අයදුම්කරුවන්ගේ කාර්යසාධනය ද සතුටුදායකය. බහුතරයක් අයදුම්කරුවන් විසින් මෙම ප්‍රශ්නය සඳහා සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි.

## ප්‍රශ්න අංක 03

පොදුකාර්ය අන්තර්ග්‍රහණ අනුපාතිකය ගණනය කිරීම මෙහිදී අපේක්ෂා කරන ලදී.

**(a) කොටස** සඳහා අයදුම්කරුවන් සාර්ථකව උත්තර සපයා සම්පූර්ණ ලකුණු ප්‍රමාණයම ලබාගෙන තිබුණි.

සමහර අයදුම්කරුවන් පොදුකාර්ය පිරිවැය රු.'000 වලින් දී තිබූ බව සැලකිල්ලට ගෙන නොතිබුණි.

තවද, සමහර අයදුම්කරුවන් එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුව සඳහා වන පොදුකාර්ය අන්තර්ග්‍රහණ අනුපාතිකයද නිවැරදිව ගණනය කර නොතිබුණි.

## ප්‍රශ්න අංක 04

මෙම ප්‍රශ්නය ශ්‍රම පිරිවැය ගණනය කිරීමට අදාලව යොමුවී තිබූ අතර දී ඇති තොරතුරු භාවිතයෙන් A සහ B ගේ මුළු ඉපැයීම් ගණනය කළ යුතු විය.

සමහර අයදුම්කරුවන් ප්‍රශ්නය සහ අවශ්‍යකරන දෑ නිවැරදිව අවබෝධ කරගෙන නොතිබුණි. අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රය සඳහා ක්‍රමානුකූලව උත්තර සපයා තිබුණි නම් වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගත හැකිව තිබුණි. බහුතරයක් අයදුම්කරුවන් අතිරේක නිමැවුම් ඒකක ප්‍රමාණය හා සාමාන්‍ය ගෙවීම ගණනය කිරීමට පැය 40 ක වැඩකාලය සහ පැයකදී අපේක්ෂිත නිමැවුම එකිනෙකට සම්බන්ධ කිරීමට උත්සාහා දරා තිබුණි.

මෙම කොටසට අදාලව දැනුම දියුණු කරගැනීම සඳහා අයදුම්කරුවන් පසුගිය විභාග ප්‍රශ්නවලට උත්තර සපයා සූදානම් විය යුතු අතර, ස්වඅධ්‍යයන පොතේ උදාහරණද කියවිය යුතුය.

## ප්‍රශ්න අංක 05

මෙම ප්‍රශ්නය තුලින් ශුන්‍ය පදනම් අයවැයකරණය පිළිබඳව විමසීමට ලක්කර තිබුණි.

උත්තර සැපයීමේදී බහුතරයක් අයදුම්කරුවන් විසින් ශුන්‍ය පදනම් අයවැයකරණය පිළිබඳ මූලිකාංග අවබෝධ කරගෙන නොතිබුණි. සැලකිය යුතු අයදුම්කරුවන් ප්‍රමාණයක් මෙම ප්‍රශ්නය සඳහා උත්තර සපයා නොතිබූ බව නිරීක්ෂණය විය. සමහර අයදුම්කරුවන් ශුන්‍ය පදනම් අයවැයකරණයේ ප්‍රතිලාභ වෙනුවට පිරිවැයකරණයේ ප්‍රතිලාභ සඳහන් කර තිබුණි. අයදුම්කරුවන් ස්වඅධ්‍යයන පොතේ පවතින න්‍යායාත්මක කරුණු අධ්‍යයනය කර තිබුණි නම්, මේ සඳහා පහසුවෙන් ලකුණු ලබාගත හැකිව තිබුණි.

## ප්‍රශ්න අංක 06

මෙම ප්‍රශ්නය තුලින් 2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා පිරිවැය ගිණුම්කරණ සහ මූල්‍ය ගිණුම්කරණය අතර, ලාභය සැසඳීමේ ප්‍රකාශනයක් පිළියෙල කිරීම අපේක්ෂා කරන ලදී.

ලාභය සැසඳීමේ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී අයදුම්කරුවන් ආරම්භක තොගය හා අවසාන තොගය වැරදි ආකාරයට ගලපා තිබුණි.

සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නයට අදාලව කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය. අයදුම්කරුවන් කිහිප දෙනෙක් පමණක් ප්‍රශ්නයට අදාලව මුළු ලකුණු ප්‍රමාණය ලබාගෙන තිබුණි. පසුගිය විභාග ප්‍රශ්නපත්‍ර වලදීද මේ හා සමාන ගැලපීම් පරීක්ෂාවට ලක්කර තිබුණි. අයදුම්කරුවන් මෙවැනි ප්‍රශ්න සඳහා පුරුදු පුහුණු විය යුතු අතර ගණනය කිරීම්වල සුළු කිරීමේ දෝෂ මගහැර ගැනීමට කටයුතු කළ යුතු වේ.

# C කොටස

(එකකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 3 කි)

(මුළු ලකුණු 30)

## ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නය යොමුවී තිබුණේ ඍජු ද්‍රව්‍ය විචලනය, ඍජු ශ්‍රම පිරිවැය විචලනය හා විචල්‍ය පොදුකාර්ය පිරිවැය විචලනය පිළිබඳවය.

අයදුම්කරුවන්ගේ කාර්යසාධනය ඉතා දුර්වල මට්ටමක පැවතිණි. අයදුම්කරුවන් සැලකිය යුතු ප්‍රතිශතයකට විචලනයන් ගණනය කිරීම පිළිබඳ දැනුමක් නොවිය. කුමන මිල හා ප්‍රමාණයන් භාවිත කරන්නේද යන්න පිළිබඳව අයදුම්කරුවන්ට පැහැදිලි අවබෝධයක් නොතිබුණු අතර, ඔවුන් විචලනයන් ගණනය කිරීම සඳහා වන වැරදි අගයන් භාවිතයට ගෙන තිබුණි. සමහර අයදුම්කරුවන් ඒ ඒ විචලනයන් වාසිදායකද අවාසිදායකද යන්න සඳහන් කර නොතිබුණි. එම නිසා අවසාන උත්තර අසම්පූර්ණ උත්තර විය. බහුතරයක් අයදුම්කරුවන් විචලනයන් ගණනය කිරීම සඳහා වැරදි සමීකරණය භාවිතයට ගෙන තිබූ අතර, සමහරක් නොසැලිකිලිමත් ලෙස ගණනය කිරීමේදී දෝෂ සිදුකර තිබුණි. සමහරක් අයදුම්කරුවන් ඍජු ද්‍රව්‍ය මිල විචලනය හා ඍජු ද්‍රව්‍ය භාවිත විචලනය නිවැරදිව ගණනය කර තිබුණද, ඍජු ද්‍රව්‍ය පිරිවැය විචලනය නිවැරදිව ගණනය කර නොතිබුණු බවක්ද නිරීක්ෂණය විය. එය ඉහත විචලනයන් දෙක එකතු කිරීමෙන් පමණක් පහසුවෙන් ලබාගත හැකිව තිබුණි.

මේ ආකාරයේ ප්‍රශ්නවලින් පිළිඹිබු වූයේ ඉතා අඩු දැනුමක් හා භාවිතයක් අයදුම්කරුවන් සතුව පැවති බවයි. මෙය පසුගිය විභාගයේදී දක්වා තිබූ අතර, මීට සමාන ආකාරයේ ප්‍රශ්න පසුගිය විභාග ප්‍රශ්න පත්‍රවලට දී තිබුණි. අයදුම්කරුවන් විසින් විචලනයන්ට අදාලව දී ඇති පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා ස්ව-අධ්‍යයන පාඩම්මාලාවෙහි උදාහරණ පුහුණුවිය යුතුය.

## ප්‍රශ්න අංක 08

මෙම ප්‍රශ්නය පිරිවැය අන්තර්ග්‍රහණය කිරීම පදනම් කරගත් ආදායම් ප්‍රකාශනය පිළිබඳව යොමුවී තිබුණි.

සමහර අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා උත්තර සැපයීමට උත්සාහා නොගැනීම පුදුම සහගතය. ප්‍රශ්නයට උත්තර සැපයූ අයදුම්කරුවන් විසින් පහත සඳහන් අඩුපාඩු සිදුකර තිබුණි:

- ස්ථාවර පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය නිවැරදිව ගණනය කර නොතිබීම.
- අවසාන තොගය නිවැරදිව ගණනය කිරීමට අපොහොසකත් වීම.
- ඒකකයක නිවැරදි ස්ථාවර පිරිවැය ගැලපීම මඟින් ඒකකයක නිවැරදි නිෂ්පාදන පිරිවැය ගණනය නොකිරීම.
- ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය ඌන අන්තර්ග්‍රහණය නිවැරදිව ගණනය නොකිරීම හා ආදායම් ප්‍රකාශන ගැලපීම් සිදුකර නොතිබීම.
- විචල්‍ය විකිණීමේ හා බෙදාහැරීමේ පිරිවැය ආදායම් ප්‍රකාශනයෙහි වියදමක් ලෙස දැක්වීමට අපොහොසත් වීම.

මෙම ආකාරයේ ප්‍රශ්නවලින් පැහැදිලි වූයේ අඩු දැනුම හා ප්‍රායෝගික භාවිතයයි. අයදුම්කරුවන් පිරිවැය අන්තර්ග්‍රහණය පිළිබඳව ඉතා හොඳ දැනුමක් ලබා ගත යුතු අතර, ස්ව-අධ්‍යයන පාඩම් මාලා ග්‍රන්ථයේ දී ඇති ප්‍රශ්න පුහුණුවීම මඟින් නිවැරදිව ප්‍රශ්නවලට උත්තර සැපයීමේ ශාක්‍යතාවයක් ලබාගත යුතුවේ. අදාල පෙරවැඩ දැක්වීම ඉතා වැදගත් වන අතර, යොදාගන්නා ලද කිසියම් උපකල්පනයන් වෙතොත් ඒවාද පැහැදිලිව දැක්විය යුතුය.

## ප්‍රශ්න අංක **09**

එක් කාර්යයක් සම්බන්ධයෙන් වන පිරිවැය ගණනය කිරීම කෙරෙහි මෙම ප්‍රශ්නය යොමු වී තිබුණි. මෙය ඉතා පහසු ප්‍රශ්නයක්ද විය.

**(a) කොටස** සඳහා බහුතරයක් අයදුම්කරුවන් ලකුණු ලබාගෙන තිබුණි. අනෙකුත් ප්‍රශ්නවලට සාපේක්ෂව අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සතුටුදායකය. සමහරක් අයදුම්කරුවන් විසින් සිදුකරන ලද පොදු වැරැද්දක් වූයේ සෘජු ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රම පිරිවැය හා පොදුකාර්ය පිරිවැය නිවැරදිව ගණනය කර තිබුණත් A111 කාර්යය සඳහා වන සම්පූර්ණ පිරිවැය ගණනය කර නොතිබීමයි.

සැලකිය යුතු අයදුම්කරුවන් ප්‍රමාණයක් **(b) කොටස** සඳහා උත්තර සපයා නොතිබුණි. ප්‍රමිත පිරිවැයකරණයේ අවාසි / සීමාකරණයන් හතරක්(4) දැක්වීම අවශ්‍ය විය. ප්‍රමිත පිරිවැය සම්බන්ධව පැවති අඩු අවබෝධය නිසා සමහරක් අයදුම්කරුවන් අදාල නොවන උත්තර සපයා තිබුණි. ප්‍රශ්නය නිවැරදිව කියවා නොතිබීම නිසා සමහර අයදුම්කරුවන් ප්‍රමිත පිරිවැයකරණයේ අවාසි වෙනුවට වාසි සඳහන් කර තිබුණි.

අයදුම්කරුවන් ලබාදී තිබූ උත්තර වලින් පැහැදිලි වූයේ ඔවුන් සැලකිල්ලෙන් යුතුව ප්‍රශ්න කියවිය යුතු බවත් ප්‍රශ්නය තුලින් අපේක්ෂිත දෙය නිවැරදිව තේරුම්ගත යුතු බවත්ය. ස්ව-අධ්‍යයන පාඩම්මාලා ග්‍රන්ථය පරිශීලනය කිරීම මේ ආකාරයේ ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගැනීමේදී ඉතා වැදගත් වේ.

# D කොටස

(අනිවාර්ය ප්‍රශ්නයකි)

(ලකුණු 25)

## ප්‍රශ්න අංක **10**

### (A) කොටස

මෙම කොටස පෙරසැරි පිරිවැයකරණය පිළිබඳව යොමුවී තිබුණි. මෙම ප්‍රශ්නයේ (A) කොටස මගින් අපේක්ෂා කර තිබුණේ (a) නිෂ්පාදන පිරිවැය ඇගයීමේ ප්‍රකාශනය හා (b) Y පෙරසැරි ගිණුම පිළියෙල කිරීමත්ය.

බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට උත්තර සපයා නොතිබීමෙන් තහවුරු වූයේ ඔවුනට පෙරසැරි පිරිවැයකරණය පිළිබඳව දැනුමක් නොවූ බවයි. සමහර අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට උත්තර සැපයීමට උත්සාහ ගෙන තිබුණත් අපේක්ෂිත ආකාරයට උත්තර සැපයීමට අදාලව අවබෝධයක් ලබා නොතිබුණි.

කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය. නොනිමි වැඩ, අසාමාන්‍ය අපතය හා නිමැවුම / නිමි භාණ්ඩ අගය කිරීමට සමහර අයදුම්කරුවන්ට දැනුමක් නොවීය. ඔවුන්ට හැකියාව තිබුණේ සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රම හා පොදුකාර්ය පිරිවැය අගයන් පෙරසැරි ගිණුමේ සඳහන් කිරීම පමණි. නිෂ්පාදන පිරිවැය ඇගයීමේ ප්‍රකාශනය සකස් කිරීමේදී අයදුම්කරුවන් විසින් සාමාන්‍ය අපතය හා සුන්බුන් වටිනාකම සැලකිල්ලට ගෙන නොතිබුණි. සමහර අයදුම්කරුවන් පෙරසැරි ගිණුම සකස් කිරීමේදී සාමාන්‍ය අපතය සැලකිල්ලට ගෙන නොතිබූ අතර, සමහරක් සාමාන්‍ය අපතය ගණනය කිරීමේදී වැරදි අගයන් භාවිත කර තිබුණි. සමහර අයදුම්කරුවන් ගණනය කිරීම සිදුකර තිබුණත් අදාල පෙරවැඩ උත්තර පත්‍රය තුළ දක්වා නොතිබුණි.

### <u>B කොටස</u>

මෙම ප්‍රශ්නය යොමු වී තිබුණේ අයවැයකරණය පිළිබඳවය. විකුණුම් අයවැය, නිෂ්පාදන අයවැය (ඒකක වලින්) හා සෘජු ද්‍රව්‍ය භාවිත අයවැය (මීටර් වලින්) දැක්වීම අවශ්‍ය කර තිබුණි.

බොහෝ අයදුම්කරුවන් නිවැරදිව මෙම ප්‍රශ්නයට උත්තර සපයා නොතිබූ අතර, සමහරක් මෙම ප්‍රශ්නයට උත්තර සැපයීමට උත්සාහ ගෙන නොතිබුණි. ඒ කෙසේ වෙතත් මෙය ලකුණු ලබාගතහැකි ඉතා පහසු ප්‍රශ්නයකි.

මෙම කොටස් පිළිබඳව අයදුම්කරුවන්ට නිවැරදි අවබෝධයක් නොතිබුණි. නිෂ්පාදන අයවැය සකස් කිරීමේදී අවශ්‍යකරන නිෂ්පාදන ඒකක ප්‍රමාණය ආරම්භක හා අවසාන තොග ගැලපීම මගින් ලබා ගැනීමට අයදුම්කරුවන්ට දැනුමක් නොවීය. සමහරක් ගණනය කිරීමේ දෝෂද සිදුකර තිබුණි.

මෙය පිරිවැය ගිණුම්කරණයේ ඉතා වැදගත් කොටසක් වන නිසා අයදුම්කරුවන් මුදල් අයවැයද ඇතුළුව ශ්‍රිතමය අයවැය පිළිබඳව අධ්‍යයනය කළ යුතුය.

\- - -

**<u>අයදුම්කරුවන්ගේ අවබෝධ කර ගැනීමේ මට්ටම වැඩිදියුණු කර ගැනීම සඳහා සැලකිල්ලට ගතයුතු පොදු කරුණු:</u>**

(1) විෂය නිර්දේශය මුළුමනින්ම අධ්‍යනය කිරීම.

(2) ප්‍රශ්න පත්‍රය ඔබට ලැබුණු පසු එහි දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවන්න (ඒ සඳහා අමතර කාලයක් දෙනු ලැබේ).

(3) අයදුම්කරුවන් අවධානයෙන් ප්‍රශ්නය කීප වතාවක් කියවා අවබෝධ කරගත යුතුය. ප්‍රශ්නය සඳහා ඍජු නිවැරදි උත්තරයක් අපේක්ෂා කර තිබෙන විට අනවශ්‍ය පැහැදිලි කිරීම් සහ විස්තර නොලිවිය යුතුය.

(4) විභාගයේදී කාර්යක්ෂම ලෙස කාලය කළමනාකරණය කරගන්න.

(5) උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංකය සහ ඔබේ විභාග අංකය නිවැරදිව ලියා තිබේදැයි දෙවරක් පරීක්ෂා කරන්න.

(6) කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථන වලට අනුකූල වෙමින් උත්තර ලියන්න.

(7) අත් අකුරු කියවිය හැකි මට්ටමට තිබීම හා උත්තර වලට ප්‍රශ්න අංක නිසිලෙස යොදා තිබීම ගැන සහතික විය යුතුය.

(8) ස්ව-අධ්‍යයන පොත, ලිපි, සඟරා, ආදිය කියවිය යුතුය.

(9) ඔබේ දැනුම වැඩිදියුණු කිරීමට, පෙර ප්‍රශ්න පත්‍ර අධ්‍යයනය කර උත්තර ලියා පුහුණු විය යුතුය.

(10) හොඳ සූදානමකින් විභාගය සමත්වීමේ පරම චේතනාව පෙරටුකොටගෙන විභාගයට මුහුණ දීම.

- * * * -